සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**ගිණුම්කරණය - I**

**Accounting - I**

33 S I

පැය 02 යි

**Time: 02 hours**

විභාග අංකය : ....................................................................

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 31 - 50 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියන්න.**

01. මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස නිවැරදි දැක්වෙන පිළිතුර නොවන්නේ,

1. මූල්‍ය ගිණුම්කරණයේ දී අතීත තොරතුරු උපයෝගී කර ගන්නා අතර කළමනාකරණ ගිණුම්කරණයේ දී අතීත, වර්තමාන හා අනාගත තොරතුරු උපයෝගී කර ගනී.
2. මූල්‍ය ගිණුම්කරණයට නිශ්චිත ප්‍රමිත, සංකල්ප ඇති අතර කළමනාකරණ ගිණුම්කරණයට එසේ නොමැත.
3. මූල්‍ය ගිණුම්කරණයේ දී මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් ද කළමනාකරණ ගිණුම්කරණයේ දී මුදලින් මැනිය හැකි මෙන් ම නොහැකි ගනුදෙනු ද සැලකිල්ලට ගනියි.
4. මූල්‍ය ගිණුම්කරණයේ දී සත්‍ය තොරතුරු පමණක් සැලකිල්ලට ගන්නා අතර කළමනාකරණ ගිණුම්කරණයේ දී සත්‍ය මෙන් ම පුරෝකථනය කරන ලද තොරතුරු ද සැලකිල්ලට ගනියි.
5. මූල්‍ය ගිණුම්කරණය මඟින් බාහිර පාර්ශවයන්ට පමණක් තොරතුරු සපයන අතර කළමනාකරණ ගිණුම්කරණය මඟින් අභ්‍යන්තර පාර්ශවයන්ට පමණක් තොරතුරු සපයයි.

(.............)

- 2019 මාර්තු මස ආරම්භ කරන ලද සුරංගගේ ව්‍යාපාරයට අදාළ ව සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත ලබා දී ඇති අතර 02, 03 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට එම තොරතුරු උපයෝගී කරගන්න.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019/03/01 | සුරංග රු.600 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කළා. |
| 2019/03/10 | පිරිවැය රු.30 000 ක් වූ තොගයක් රු.50 000 කට විකුණූ අතර රු.25 000 ක් එම අවස්ථාවේ දී ම ලැබුණි. ඉතිරිය දින 30 කින් ලබා දීමට ගනුදෙනුකරු එකඟ විය. |
| 2019/03/15 | රු.250 000 ක යන්ත්‍රයක් මිලට ගත් අතර තවත් අවුරුදු 02 කින් එහි වෙළෙඳපොළ අගය රු.300 000 කි. |
| 2019/03/31 | යන්ත්‍ර ක්ෂය රු.1 000 කි. (මාසික) |

02. ඉහත ගනුදෙනුවල ශුද්ධ බලපෑම නිවැරදි ව දැක්වෙන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|
| 1. | + 619 000 | | + 619 000 | | - |
| 2. | + 869 000 | | + 619 000 | | + 250 000 |
| 3. | + 919 000 | | + 619 000 | | + 300 000 |
| 4. | + 599 000 | | + 599 000 | | - |
| 5. | + 620 000 | | + 619 000 | | + 1 000 |

(............)

03. ඉහත ගනුදෙනු ගිණුම්ගත කිරීමේ දී උපයෝගී කර ගන්නා සංකල්ප පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. විචක්ෂණ සංකල්පය, උපචිත සංකල්පය, ඓතිහාසික පිරිවැය සංකල්පය, ගැලපුම් සංකල්පය
2. ඒකක සංකල්පය, උපලබ්ධි සංකල්පය, ඓතිහාසික පිරිවැය සංකල්පය, ගැලපුම් සංකල්පය
3. මූල්‍ය මිණුම් සංකල්පය, උපලබ්ධි සංකල්පය, ද්වයාත්මක සංකල්පය, ගැලපුම් සංකල්පය
4. ඒකක සංකල්පය, උපචිත සංකල්පය, ඓතිහාසික පිරිවැය සංකල්පය, කාලච්ඡේද සංකල්පය
5. ආරක්ෂණ සංකල්පය, උපලබ්ධි සංකල්පය, කාලච්ඡේද සංකල්පය, ගැලපුම් සංකල්පය

(............)

04. වැඩි වීම බැර, අඩු වීම හර යන මූලධර්මයට අදාළ ගිණුම් පමණක් ඇති පිළිතුර තෝරන්න.

1. හානිකරන අලාභ සඳහා වෙන් කිරීම, කොමිස් ආදායම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම
2. බැංකු ණය ගිණුම, ආපසු යැවුම් ගිණුම, ගැනිලි ගිණුම
3. ගොඩනැගිලි ගිණුම, විදුලි වියදම් ගිණුම, වෙළෙඳ ලැබිය යුතු දෑ ගිණුම
4. ක්ෂය වෙන්කිරීමේ ගිණුම, තොග ගිණුම, ප්‍රාග්ධන ගිණුම
5. සේවක පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුම, ආපසු එවුම් ගිණුම, ගැනිලි ගිණුම

(............)

- 05 හා 06 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න. කාර්යාල උපකරණ අලෙවි කරන නුවන්ගේ ව්‍යාපාරය 2019/05/05 දින රු.450 000 ක කාර්යාල උපකරණ ණයට ගත් අතර ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා 2019/05/07 දින රු.600 000 ක ගොඩනැගිල්ලක් ණයට ගන්නා ලදි. 2019/05/15 දින ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී ලද වට්ටම රු.10 000 කි.

05. ඉහත ගනුදෙනු වාර්තා කිරීමට නුවන්ගේ ව්‍යාපාරය භාවිතා කරන මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්,

1. ජ'නල් වවුචරය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය
2. ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය
3. ගැනුම් ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය
4. ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය
5. ගැනුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය

(............)

06. ඉහත ගනුදෙනු හේතුවෙන් නුවන්ගේ ව්‍යාපාරයේ මැයි මාසයේ ලාභයට ඇති වන බලපෑම කොපමණ ද?

1. රු. 440 000 කින් අඩු වේ.
2. රු. 10 000 කින් වැඩි වේ.
3. රු. 440 000 කින් වැඩි වේ.
4. රු. 1 040 000 කින් අඩු වේ.
5. බලපෑමක් නැත.

(............)

07. සිසිරගේ ව්‍යාපාරය 2019/03/31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම සමාන නොවූ අතර පසුව කළ සොයා බැලීමක දී පහත වැරදි හා අත්හැරීම් අනාවරණය කරගෙන ඇත.

- ණයහිමියන්ගෙන් ලද වට්ටම රු.5 000 ක් ණයහිමි පාලන ගිණුමෙන් හා උප ලෙජරයෙන් මඟහැරී ඇත.
- රු.60 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් මඟහැරී ඇත.
- ගොඩනැගිලි කුලී වියදම් ගිණුමේ ශේෂය රු.4 000 ක් ශේෂ පිරික්සුමෙන් මඟහැරී ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය කොපමණ ද?

1. රු. 9 000 ක් බැර
2. රු. 14 000 ක් හර
3. රු. 51 000 ක් බැර
4. රු. 14 000 ක් බැර
5. රු. 9 000 ක් හර

(............)

- 08, 09, 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.

නිලන්තගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය එකිනෙකට සමාන නොවූ අතර වෙනසට පහත හේතු සොයා ගෙන ඇත.එදිනට මුදල් පාලන ගිණුමේ වූ ශේෂය රු.60 000 කි.

- ඉදිරිපත් නොවූ චෙක්පත් රු.25 000
- වැරදීමකින් බැංකු ප්‍රකාශනයේ දෙවරක් සටහන් වූ බැංකු ගාස්තු රු.5 000
- ණයගැති ප්‍රේෂණ රු.30 000

08. 2020/03/31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය කොපමණ ද?

1. රු. 55 000
2. රු. 85 000
3. රු. 115 000
4. රු. 105 000
5. රු. 110 000

(............)

09. 2020/03/31 දිනට සංශෝධිත මුදල් ශේෂය කොපමණ ද?

1. රු. 90 000
2. රු. 85 000
3. රු. 55 000
4. රු. 105 000
5. රු. 35 000

(............)

10. නිලන්තගේ ව්‍යාපාරයේ හානිකරන ණයගැතියන් සඳහා වෙන්කිරීමේ ප්‍රතිශතය 10% කි. ඉහත ගනුදෙනු සටහන් කිරීම හේතුවෙන් කාලච්ඡේදයේ ලාභයට වන බලපෑම කොපමණ ද?

1. රු. 5 000 කින් අඩු වේ.
2. රු. 3 000 කින් වැඩි වේ.
3. රු. 2 000 කින් වැඩි වේ.
4. රු. 5 000 කින් වැඩි වේ.
5. රු. 2 000 කින් අඩු වේ.

(............)

11. මූලික සටහන් පොත් සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත ලබා දී ඇත.

A - සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම තීරණය කරනුයේ සුළු මුදල් භාරකරු විසිනි.

B - බොල්ණය සටහන් කිරීමට යොදාගන්නා මූලික සටහන් පොත පොදු ජ'නලයයි.

C - නැවත විකිණීමේ අරමුණින් අත්පත් කරගන්නා සියලු තොග ගැනුම් ජ'නලයේ සටහන් කරයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

1. B පමණි.
2. A හා C පමණි.
3. A හා B පමණි.
4. B හා C පමණි.
5. A, B, C සියල්ලම.

(.............)

12. ව්‍යාපාරයක 2020 මාර්තු මාසයේ ණයහිමියන්ට අදාළ ව සිදු වූ ගනුදෙනු වල සාරාංශයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ගැනුම්, ණයට | රු. 620 000 |
| අත්පිට | රු. 550 000 |
| මුදල් ගෙවීම් | රු. 350 000 |
| පමා පොළී අයකිරීම් | රු. 30 000 |
| ආපසු යැවුම් | රු. 75 000 |
| ලද වට්ටම් | රු. ? |
| ශේෂය, 2019/03/31 දිනට | රු. 360 000 |
| 2019/03/01 දිනට | රු. 150 000 |

ණයහිමියන්ගෙන් ලද වට්ටම කොපමණ ද?

1. රු. 435 000
2. රු. 565 000
3. රු. 15 000
4. රු. 45 000
5. රු. 30 000

(.............)

- රුවන්ගේ ව්‍යාපාරය 2015 වර්ෂයේ දී මිලට ගත් පිරිවැය රු.1 200 000 ක් වූ ඉඩමක් 2019 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කරන ලදි.

13. ඉහත ක්‍රියාව හේතුවෙන් කඩවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. මූල්‍ය මිණුම් සංකල්පය
2. කාලච්ඡේද සංකල්පය
3. විචක්ෂණ සංකල්පය
4. අනුසිහුම් සංකල්පය
5. ඓතිහාසික පිරිවැය සංකල්පය

(.............)

14. එය අනුගත වන ගුණාත්මක ලක්ෂණය වන්නේ,

1. සත්‍යාපනය කළ හැකි බව
2. අදාළ බව
3. කාලීන බව
4. තේරුම්ගත හැකි බව
5. විශ්වසනීය නියෝජනය

(.............)

15. ගිණුම්කරණ සංකල්ප කිහිපයක් හා ඒවායෙහි භාවිතයන් කිහිපයක් පහත ලබා දී ඇත.

| ගිණුම්කරණ සංකල්පය | භාවිතය |
|---|---|
| A - සංගතතා සංකල්පය | 1 - මූල්‍ය ප්‍රකාශනවල ඉහළින් ව්‍යාපාරයේ නම සඳහන් කිරීම |
| B - විචක්ෂණ සංකල්පය | 2 - තොග අගය කරන ක්‍රමය ඒකාකාරීව පවත්වා ගෙන යාම |
| C - ආයතනික සංකල්පය | 3 - ණයගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කිරීම |
| D - උපචිත සංකල්පය | 4 - උපචිත ආදායම්, වියදම් සැලකිල්ලට ගැනීම |

ඉහත ගිණුම්කරණ සංකල්ප ඒවායෙහි භාවිතය සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. A-3, B-2, C-1, D-4
2. A-2, B-1, C-3, D-4
3. A-1, B-2, C-3, D-4
4. A-2, B-3, C-1, D-4
5. A-1, B-3, C-2, D-4

(.............)

- නිෂ්පාදන ව්‍යාපාරයක් වන ලහිරුගේ ව්‍යාපාරයට අදාළ ව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය පිරිවැය | රු. 320 000 |
| අවසන් නොනිමි ද්‍රව්‍ය පිරිවැය | රු. 30 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 130 000 |
| පොදු කාර්යය පිරිවැය | රු. 300 000 |
| ආරම්භක නොනිමි ද්‍රව්‍ය පිරිවැය | රු. 80 000 |

16. ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

1. රු. 800 000 2. රු. 450 000 3. රු. 700 000
4. රු. 860 000 5. රු. 640 000

(.............)

17. ව්‍යාපාරයේ පරිවර්තන පිරිවැය කොපමණ ද?

1. රු. 300 000 2. රු. 350 000 3. රු. 800 000
4. රු. 450 000 5. රු. 480 000

(.............)

18. අමාගේ ව්‍යාපාරය EPF හා ETF සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන අතර EPF සඳහා සේවක දායකත්වය 10% ක් ද සේව්‍ය දායකත්වය 15% ක් ද ETF සඳහා දායකත්වය 3% ක් ද වේ. ව්‍යාපාරය කාර්තු 03 ක දායකත්වයන් ගෙවා ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් උපචිත EPF වටිනාකම රු.6 000 කි. ව්‍යාපාරය දළ වැටුප මත EPF, ETF ගණනය කරයි. ව්‍යාපාරයේ වැටුප් වියදම කොපමණ ද?

1. රු. 200 000 2. රු. 880 000 3. රු. 800 000
4. රු. 60 000 5. රු. 240 000

(.............)

19. ව්‍යාපාරයක් 2019/04/01 දිනට පිරිවැය රු.750 000 ක් හා සමුච්චිත ක්ෂය රු.175 000 වූ යන්ත්‍රයක් 2020/03/31 දින රු.650 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි. යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවු. 10 ක් හා සුන්බුන් අගය රු.50 000 ක් වේ. යන්ත්‍රයේ ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය කොපමණ ද?

1. රු. 145 000 ක අලාභයකි. 2. රු. 75 000 ක ලාභයකි.
3. රු. 145 000 ක ලාභයකි. 4. රු. 75 000 ක අලාභයකි.
5. රු. 195 000 ක ලාභයකි.

(.............)

20. ව්‍යාපාරයක් 2015/04/01 දින පිරිවැය රු.650 000 ක් හා සුන්බුන් අගය රු.50 000 ක් වූ යන්ත්‍රයක් මිලට ගන්නා ලදි. එහි ඵලදායී ජීව කාලය අවු. 10 ක් ලෙසත් යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමටත් තීරණය කරන ලදි. නමුත් 2019/03/31 දින යන්ත්‍රයේ සුන්බුන් අගය රු.10 000 කින් වැඩි වන බවත් යන්ත්‍රය තවත් අවු. 07 ක් භාවිතා කළ හැකි බවත් තක්සේරු කරන ලදි. 2019/20 කාලච්ඡේදයේ යන්ත්‍ර ක්ෂය වියදම කොපමණ ද?

1. රු. 60 000 2. රු. 57 150 3. රු. 31 820
4. රු. 52 860 5. රු. 50 000

(.............)

21. තත්සරගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | 2019/04/01 දිනට (රු.) | 2020/03/31 දිනට (රු.) |
|---|---|---|
| අඩමාණ ණය වෙන් කිරීම | 64 000 | 80 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 800 000 | 1 000 000 |

පහත කුමක් නිවැරදි වේ ද?

| | අඩමාණ ණය ප්‍රතිශතය (%) | 2019/20 කාලච්ඡේදයේ අඩමාණ ණය වියදම (රු.) |
|---|---|---|
| 1. | 10 | 64 000 |
| 2. | 10 | 16 000 |
| 3. | 8 | 80 000 |
| 4. | 8 | 16 000 |
| 5. | ඉහත කිසිවක් නොවේ. | |

(.............)

22. 2018/04/01 දින ආරම්භ කරන ලද ''හිරු සඳු'' සමිතියේ වත්කම් සහ වගකීම් පිළිබඳ පහත තොරතුරු ඔබට සපයා ඇත.

| විස්තරය | 2019/03/31 දිනට (රු.) | 2020/03/31 දිනට (රු.) |
|---|---|---|
| ගොඩනැගිලි (ධාරණ වටිනාකම) | - | 500 000 |
| මුදල් | 260 000 | 290 000 |
| කලින් ලද සාමාජික මුදල් | 40 000 | 60 000 |
| උපචිත විදුලිය | 20 000 | - |
| ලැබිය යුතු සාමාජික මුදල් | - | 50 000 |

2018/19 කාලච්ඡේදයේ හා 2019/20 කාලච්ඡේදයේ අතිරික්තය තෝරන්න.

| | 2018/19(රු.) | 2019/20(රු.) |
|---|---|---|
| 1. | අතිරික්තයක් නොමැත | 580 000 |
| 2. | 200 000 | 580 000 |
| 3. | 200 000 | 780 000 |
| 4. | 320 000 | 900 000 |
| 5. | 580 000 | 200 000 |

(.............)

23. ''රන්තරු'' ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් වලට අදාල ව පහත තොරතුරු ලබා දී ඇත.

2020/03/31 දිනට ; ලැබිය යුතු සාමාජික මුදල් රු. 65 000

කලින් ලද සාමාජික මුදල් රු. 20 000

2019/03/31 දිනට ; ලැබිය යුතු සාමාජික මුදල් රු. 40 000

මුදලින් ලද සාමාජික මුදල (2019/20 කාලච්ඡේදයේ) රු. 375 000

2019/20 කාලච්ඡේදයට අදාල සාමාජික මුදල් ආදායම කොපමණ ද?

1. රු. 380 000    2. රු. 370 000    3. රු. 375 000
4. රු. 290 000    5. රු. 330 000

(.............)

- AB හවුල් ව්‍යාපාරයට අදාලව ලබා දී ඇති පහත තොරතුරු උපයෝගී කර ගනිමින් 24, 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් ශේෂ ; | 2019/04/01 දිනට ; | A - රු. 500 000 | B - රු. 600 000 |
| | 2020/03/31 දිනට ; | A - රු. 500 000 | B - රු. 600 000 |
| ජංගම ගිණුම් ශේෂ ; | 2019/04/01 දිනට ; | A - රු. 75 000 | B - රු. (20 000) |
| | 2019/03/31 දිනට ; | A - රු. 140 000 | B - රු. 90 000 |
| ගැනිලි ; A - රු. 20 000 | | | |
| ප්‍රාග්ධන පොළී ; A - රු. 25 000 | | B - රු. 30 000 | |

24. 2019/20 කාලච්ඡේදයේ AB හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කළ හැකි ලාභය කොපමණ ද?

1. රු. 195 000 2. රු. 140 000 3. රු. 100 000
4. රු. 155 000 5. රු. 190 000

(............)

25. A හා B අතර ලාභ අනුපාතය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. 5 : 6 2. 1 : 2 3. 2 : 3
4. 1 : 1 5. 3 : 4

(............)

26. සම සම ව ලාභ බෙදාගත් X, Y ව්‍යාපාරයට 2019/04/01 දින රු.750 000 ක් ආයෝජනය කරමින් C ඇතුළත් වූ අතර X, Y, Z අතර නව ලාභ අනුපාතය පිළිවෙළින් 2 : 1 : 1 කි. කීර්තිනාමය ගැලපීමට පෙර A ගේ ප්‍රාග්ධන ශේෂය රු.1 000 000 ක් හා B ගේ ප්‍රාග්ධන ශේෂය රු.800 000 ක් වූ අතර කීර්තිනාමය ගැලපීමෙන් පසු C ගේ ප්‍රාග්ධන ශේෂය රු.450 000 කි. කීර්තිනාම වටිනාකම කොපමණ ද?

1. රු. 300 000 2. රු. 1 200 000 3. රු. 1 000 000
4. රු. 2 550 000 5. රු. 1 100 000

(............)

27. සී/ස පුබුදු පොදු සමාගමේ 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශන 2020/05/25 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද අතර 2020/06/15 දින අධ්‍යක්ෂවරු අනුමත කරන ලදි. එම කාලපරිච්ඡේදය තුළ සමාගමේ සිදු වූ සිදුවීම් පහත ලබා දී ඇත.

A - 2020/03/31 දිනට පිරිවැය රු.780 000 ක් වූ තොග 2020/05/20 දින රු.700 000 කට අලෙවි කිරීම.

B - 2020/03/31 දිනට පැවති රු.120 000 ක ණයගැතියෙකු 2020/06/25 දින බුන්වත් විය.

C - 2020/05/30 දින සමාගමේ ආයෝජනවල අගය රු.200 000 කින් පහත වැටුණි.

ඉහත සිදුවීම් අතර LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතු සිදුවීම/ සිදුවීම් වන්නේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A හා B පමණි. 5. A, B, C සියල්ලම.

(............)

▪ 28, 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සී/ස අරලිය පොදු සමාගමේ 2019/04/01 දිනට හිමිකම පහත අයිතම වලින් සමන්විත විය.

| | | |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (රු.) | - | 2 500 000 |
| රඳවාගත් ඉපැයුම් | - | 1 500 000 |
| ප්‍රත්‍යාගණන සංචිත | - | 600 000 |

සමාගම 2019/10/01 දින රු.500 000 ක සංචිත ප්‍රාග්ධනීකරණයක් සිදු කරන ලදි. තව ද රු.300 000 ක් ලාභාංශ ලෙස ගෙවන ලද අතර රු.100 000 ක් පොදු සංචිතයට මාරු කරන ලදි. 2020/03/31 දේ.පි.උ දෙවන වර ප්‍රත්‍යාගණනයෙන් පසු රු.150 000 ක අලාභයක් ඇති විය.

28. 2019/20 කාලච්ඡේදයේ ශුද්ධ ලාභය හා මුළු විස්තීර්ණ ආදායම කොපමණ ද?

| | කාලච්ඡේදයේ ශුද්ධ ලාභය (රු.) | මුළු විස්තීර්ණ ආදායම (රු.) |
|---|---|---|
| 1. | 700 000 | (150 000) |
| 2. | 400 000 | 550 000 |
| 3. | 700 000 | 550 000 |
| 4. | 400 000 | 250 000 |
| 5. | 550 000 | (150 000) |

(............)

29. 2020/03/31 දිනට සමාගමේ මුළු හිමිකම වන්නේ,

1. රු. 4 750 000 2. රු. 4 350 000 3. රු. 5 000 000
4. රු. 4 500 000 5. රු. 4 850 000

(............)

30. සමාගමක මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ඇතුළත් නොවන්නේ,

1. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 2. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
3. හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය 4. පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
5. ගිණුම්කරණ සටහන්

(............)

31. පහත ප්‍රකාශයන්හි සත්‍ය අසත්‍ය බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - ශේෂ පිරික්සුම යනු මූල්‍ය ප්‍රකාශනයකි | ........................................................ |
| B - මූලික සටහන් පොත් සඳහා නිශ්චිත ආකෘතියක් නැත | ........................................................ |
| C - ශේෂ පිරික්සුම යනු මූල්‍ය ප්‍රකාශනයකි | ........................................................ |
| D - ගණුදෙනු මූලාශ්‍ර ලේඛනවල සටහන් කිරීමට පෙර මූලක සටහන් පොත්වල සටහන් කරනු ලබයි | ........................................................ |

32. නුවන්ගේ ව්‍යාපාරයේ 2019/04/01 දිනට වත්කම් රු.800 000 ක් හා වගකීම් රු.150 000 ක් විය. කාලච්ඡේදය තුළ දී අයිතිකරු මසකට රු.5 000 ක් බැගින් වර්ෂය පුරා ගැනිලි සිදු කර ඇත. 2020/03/31 දිනට ව්‍යාපාරය සතු ශුද්ධ වත්කම් රු.800 000 ක් හා කාලච්ඡේදය තුළ වගකීම්වල වැඩි වීම රු.50 000 කි.

i. 2019/20 කාලච්ඡේදයේ ශුද්ධ ලාභය කොපමණ ද?
........................................................

ii. 2019/20 කාලච්ඡේදය තුළ වත්කම්වල වෙනස කොපමණ ද?

.........................................................

33. පහත ගණුදෙනු වාර්තා කිරීමට අදාළ මූලික සටහන් පොත් සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික සටහන් පොත |
|---|---|
| A - රු. 800 000 ක මෝටර් රථයක් ණයට විකිණීම | ......................................................... |
| B - රු. 50 000 ක රක්‍ෂණ වාරිකය ගෙවීම | ......................................................... |
| C - ණයගැති ශේෂය මත රු. 2 000 ක් අඩමාණ ණය වෙන්කිරීම | ......................................................... |
| D - රු. 30 000 ක තොගයක් ණයට විකිණීම | ......................................................... |

34. පහත ගණුදෙනු වාර්තා කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| A - බොල් ණය කපා හැරීම රු. 4000 ගිණුම් පොත්වලින් මඟහැරීමේ වරද නිවැරදි කිරීම | ......................................................... |
| B - ණයට ගැණුම් ආපසු යැවීම රු. 10 000 කි. | ......................................................... |
| C - රු. 5000 ක ණයගැති ශේෂය ණයහිමි ශේෂයට හිලව් කිරීම | ......................................................... |
| D - රු. 3000 ක කොමිස් ආදායම් ලැබීම | ......................................................... |

35. පහත ගණුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| A - රු. 1000 ක පොළියක් සහිත ව බැංකු ණය වාරිකය | ......................................................... |
| ලෙස රු. 6000 ක් ගෙවීම. | ......................................................... |
| B - ගොඩනැගිලි කුලී වියදම රු. 5000 ක් වූ අතර ඒ සඳහා | ......................................................... |
| රු. 8000 ක් මුදලෙන් ගෙවීම | ......................................................... |

36. පහත එක් එක් අවස්ථාවට අදාළ ගිණුම්කරණ සංකල්ප සඳහන් කරන්න.

| අවස්ථාව | සංකල්පය |
|---|---|
| A - සේවක දක්‍ෂතා ගිණුම්ගත නොකිරීම | ......................................................... |
| B - අයිතිකරුට ගෙවන ලද වේතන පරිපාලන වියදම් යටතේ දක්වා ඇත | ......................................................... |
| C - දේ.පි.උ ක්‍ෂය කිරීමට අනුගමනය කළ ක්‍ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් වේ | ......................................................... |
| D - නොගෙවන ලද විදුලි බිල් වටිනාකම විදුලි වියදම් ලෙස සටහන් කර ඇත | ......................................................... |

37. විකුණුම් මිල මත 20% ක් ලාභ තබා ගනිමින් භාණ්ඩ අලෙවි කරන ව්‍යාපාරයක් පිරිවැය රු. 240 000 ක් වූ තොගයක් ණයට විකුණන ලදි. පසුදින ඉන් විකුණුම් මිල රු. 50 000 ක් වූ තොග ණයගැතියන් විසින් ආපසු යවන ලදි. පසුව ණයගැතියන් විසින් 5% ක වට්ටමක් සහිතව රු. 190 000 ක් ගෙවන ලදි.

ඉහත ගණුදෙනුවේ ශුද්ධ බලපෑම පහත ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| ................................ | | ................................ | | ................................ |

38. පොදු ජ'නලයක සටහන් කරන ගණුදෙනු වර්ග 04 ක් ලියා දක්වන්න.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

39. පහත දැක්වෙන්නේ ජය ශ්‍රී ව්‍යාපාරයේ ගිණුම් තැබීමේ දී සිදු වූ වැරදි කිහිපයකි. එම දෝෂ නිවැරදි කිරීමේ ජ'නල් සටහන් ලියන්න. (වටිනාකම් සහිතව)

A - විදුලි වියදම් ගෙවීම රු. 5000 ක්, රු. 500 ක් ලෙස ගිණුම්වල පැතිමාරු කර සටහන් කර ඇත.

..................................................................................................................................

..................................................................................................................................

B - ගොඩනැගිලි කුලී අත්තිකාරම් සඳහා ගෙවූ රු. 10 000 ගොඩනැගිලි කුලී වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

..................................................................................................................................

..................................................................................................................................

40. රමේෂ්ගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට ණයගැති ශේෂ ලැයිස්තුවට අනුව ශේෂය රු. 580 000 ක් වූ අතර එය එදිනට D ට ණයගැති පාලන ගිණුමේ ශේෂය හා සමාන නොවීය. වෙනසට පහත හේතු බලපා ඇත.

- රු. 80 000 ක ණයට විකුණුම් පොදු ලෙජරයෙන් මගහැරී ඇත.
- රු. 20 000 ක ණයගැති ශේෂයක් ණයගැති ශේෂ ලැයිස්තුවෙන් මගහැරී ඇත.
- බොල්ණය කපා හැරීම රු. 10 000 ක් පාලන ගිණුමේ වැරදි පැත්තෙන් සටහන් කර ඇත.
- දුන් වට්ටම් රු. 5 000 ක් උප ලෙජරයේ රු. 15 000 ක් ලෙස සටහන් කර ඇත.

2020/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ පැවති ශේෂය කොපමණ ද? ....................................................

41. ව්‍යාපාරයක ණයහිමියන්ට අදාළ ව සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත ලබා දී ඇත.

- කාලච්ඡේදයේ මුළු ගැනුම් රු. 600 000 ක් වූ අතර ඉන් 40% ක් අත්පිට වේ.
- ආපසු යැවුම් රු. 50 000 කි.
- 20% ක වට්ටමක් සහිත ව ණයහිමියන්ට ගෙවූ මුදල රු. 340 000
- 2019/03/31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු. 120 000

2020/03/31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය කොපමණ ද? ...............................................................

42. බැංකු සැසඳුම් ප්‍රකාශයක් සකස් කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 04 ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

43. ලසන්තගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට සකස් කළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අනුව ශුද්ධ ලාභය රු. 750 000 ක් විය. නමුත් 2018/04/01 දිනට පැවති තොගය රු. 70 000 කින් අධිතක්සේරු වී ඇති බව පසුව අනාවරණය විය. 2019/20 කාලච්ඡේදයේ සංශෝධිත ශුද්ධ ලාභය කොපමණ ද?

........................................................................................................................................

44. ව්‍යාපාරයක 2019/20 කාලච්ඡේදයේ මෙහෙයුම් වියදමට අදාළ තොරතුරු පහත ලබා දී ඇත.

| | 2019/03/31 දිනට | 2020/03/31 දිනට |
|---|---|---|
| ඉදිරියට ගෙවූ | 10 000 | - |
| ගෙවිය යුතු | 25 000 | 40 000 |

කාලච්ඡේදය තුළ දී මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් රු. 175 000 කි. 2019/20 කාලච්ඡේදයේ මෙහෙයුම් වියදමට අදාළ පියවීම් සටහන ලියා දක්වන්න.

........................................................................................................................................
........................................................................................................................................

45. VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකට අදාළ VAT ප්‍රතිශතය 20% කි.

VAT සහිත අත්පිට විකුණුම් රු. 540 000
VAT සහිත ආපසු එවුම් රු. 120 000
VAT ගෙවීම රු. 50 000

2020/03/31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ VAT සම්බන්ධයෙන් පෙන්විය යුතු ජංගම වත්කම් හෝ වගකීම් කොපමණ ද?

........................................................................................................................................

46. ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කලහැකි අවස්ථා 02 ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................

47. LKAS 10 ට අනුව වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු කාලච්ඡේදයේ සිදුවන මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් කරන සිද්ධීන් 04 ක් ලියන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

48. සී/ස ප්‍රතිභා සමාගමේ 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ හිමිකම් වෙනස් වීමේ ප්‍රතිපත්තියේ සටහන් කර තිබූ ගණුදෙනු කිහිපයක් පහත උපුටා දක්වා ඇත.

| | සාමාන්‍ය කොටස් | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපයුම් |
|---|---|---|---|---|
| A | 1 500 | - | - | - |
| B | - | - | - | (200) |
| C | - | 100 | - | (100) |
| D | - | - | (150) | 900 |

ඉහත ගණුදෙනු වටිනාකම් සහිතව විස්තර කරන්න.

A- ..........................................................................................................................................

B- ..........................................................................................................................................

C- ..........................................................................................................................................

D- ..........................................................................................................................................

49. සී/ස නාමල් පොදු සමාගමේ 2019/03/31 දිනට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය කොටස් 400 000 ක් හා එහි වටිනාකම රු. 10 000 ක් විය. සමාගම 2019/10/01 දින පැරණි මිලටම කොටස් 10 000 ක සාමාන්‍ය කොටස් නිකුතුවක් සිදු කරන ලදි. තව ද 2020/01/01 දින කොටසක් රු.20 බැගින් රඳවාගත් ඉපයුම් වලින් රු. 400 000 ක් ප්‍රාග්ධනිත කරන ලදි. 2020/03/31 දිනට සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය කොපමණ ද?

රු. ..........................................................................................................................................

50. සී/ස පොදු සමාගම 2019/20 කාලච්ඡේදය තුළ දී ආදායම් බදු ලෙස රු. 500 000 ක් ගෙවන ලදි. ඉන් රු. 100 000 ක් 2018/19 කාලච්ඡේදයේ අවසන් කාර්තුව සඳහා අදාළ වේ. නමුත් 2018/19 කාලච්ඡේදයේ අවසන් කාර්තුවේ ආදායම් බද්ද රු. 200 000 ත් ලෙසත් 2019/20 කාලච්ඡේදයේ ආදායම් බද්ද රු. 800 000 ක් ලෙසත් තක්සේරු කර එවා ඇත.

i. 2019/20 කාලච්ඡේදයේ ආදායම් බදු වියදම කොපමණ ද? ..........................................................................

ii. 2020/03/31 දින ආදායම් බදු සම්බන්ධ වගකීම කොපමණද ? ..........................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**ගිණුම්කරණය - II**

**Accounting - II**

33 | S | II

පැය 03 යි විනාඩි 10

**Time:03hs & 10mts**

විභාග අංකය : ....................................................................

**උපදෙස් :**

- **පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුලු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. සී/ස සයුරු පොදු සමාගමේ 2020/03/31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

(රු.000)

| විස්තරය | හර | බැර |
|---|---|---|
| තොගය | 2 200 | |
| විකුණුම් හා විකුණුම් පිරිවැය | 45 000 | 87 750 |
| දේපළ පිරියත හා උපකරණ පිරිවැය(2019/04/01 දිනට) | 73 000 | |
| දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය (2019/04/01 දිනට) | | 15 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 15 150 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 6 560 |
| බොල් ණය | 50 | |
| ගොඩනැගිලි කුලී | 120 | |
| අධ්‍යක්ෂ ගාස්තු | 900 | |
| විගණන ගාස්තු | 300 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 20 | 40 |
| 15% බැංකු ණය (2019/10/01 දින ලබා ගත්) | | 2 000 |
| හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම (2019/04/01 දිනට) | | 1 200 |
| විදුලි වියදම් | 30 | |
| ගෙවූ බැංකු ණය පොළී | 150 | |
| ආදායම් බදු වෙන් කිරීම් (2018/19 සඳහා) | | 50 |
| ගෙවූ ආදායම් බදු | 180 | |
| මුළු හිමිකම (2019/04/01 දිනට) | | 45 000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 21 000 | |
| කොටස් නිකුතු ගිණුම් | | 500 |
| | 158 100 | 158 100 |

අමතර තොරතුරු,

1. 2020/03/31 දිනට තොගයේ අපේක්ෂිත විකුණුම් මිල හා අපේක්ෂිත විකුණුම් වියදම පිළිවෙළින් රු. 1 900 000 ක් හා රු. 100 000 ක් ලෙස ඇස්තමේන්තු කිරීම.

2. 2019/04/01 දින හිමිකම් සංයුතිය පහත පරිදි විය.

| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (රු.) | ප්‍රත්‍යාගණන සංචිතය (රු.) | රඳවාගත් ඉපයුම් (රු.) |
|---|---|---|
| 30 000 000 | 3 000 000 | 12 000 000 |

3. 2020/03/31 දිනට වූ වෙළෙඳ ලැබිය යුතු දැ ශේෂයෙන් රු. 150 000 ක් බොල් ණය ලෙස කපාහැර ඉතිරි වෙළෙඳ ලැබිය යුතු දැ ශේෂය මත 10% ක් හානිකරණ අලාභ සඳහා වෙන් කළ යුතුය.

4. 2019/04/01 දිනට දේ.පි.උ වල සංයුතිය පහත දැක්වේ.

| | ඉඩම් | ගොඩනැගිලි | කාර්යාල උපකරණ |
|---|---|---|---|
| පිරිවැය (රු.) | 28 000 000 | 30 000 000 | 15 000 000 |
| සමුච්චිත ක්ෂය (රු.) | - | 12 000 000 | 3 000 000 |

- 2020/03/31 දින ඉඩම් රු. 30 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.
- පිරිවැය රු. 5 000 000 ක් වූ කාර්යාල උපකරණ 2019/10/01 දින විකුණන ලදි. විකිණීමෙන් ලද මුදල රු. 2 750 000 මුදල් ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇති අතර 2019/04/01 දිනට වූ සියලුම කාර්යාල උපකරණ 2017/03/31 දින මිලට ගෙන ඇත.
- 2019/10/01 දින පිරිවැය රු. 10 000 000 ක යන්ත්‍රයක් මිලට ගෙන ඇත.
- ඉඩම් හැර සියලුම දේ.පි.උ පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතුය.

5. 2020/01/01 දින කොටසක් රු. 50 බැගින් කොටස් 10 000 ක් නිකුතු කර ඇති අතර ලද මුදල මුදල් ගිණුමට හර කර කොටස් නිකුතු කිරීමේ ගිණුමට බැර කර ඇත.
6. ගෙවූ ආදායම් බදුවලින් රු. 80 000 ක් 2018/19 කාලච්ඡේදය සඳහා වන අතර 2019/20 කාලච්ඡේදය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බද්ද රු. 170 000 කි.

7. 2019/20 කාලච්ඡේදයේ වියදම් වලට අදාළව පහත තොරතුරු සපයා ඇත.
   - උපචිත විගණන ගාස්තු රු. 200 000
   - ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලී රු. 20 000

8. 2020/03/31 දින අධ්‍යක්ෂවරුන්ගේ යෝජනා පහත දැක්වේ.
   - කොටසකට රු. 1 බැගින් ලාභාංශ ගෙවීම
   - රඳවාගත් ඉපයුම්වලින් රු. 500 000 ක් භාවිත කරමින් පොදු සංචිතයක් ආරම්භ කිරීම.

අවශ්‍ය වන්නේ,
(1) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
(2) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාහනය
(3) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්
(4) 2020/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 20)

02. (අ) සරසවි පොත් ප්‍රකාශකයෝ 'බුදුදහම හා ජීවිතය' නමින් පොතක් මුද්‍රණයට අදාල පහත තොරතුරු රැස්කර ගෙන ඇත.

i. මුද්‍රණ හා නිමැවුම් නමින් නිෂ්පාදන අංශ දෙකක් හා එක් ගබඩා සේවා අංශයක් සඳහා අදාල තොරතුරු.

නිෂ්පාදන අංශ දෙක එක් ගොඩනැගිල්ලක හා ගබඩා අංශය වෙනම ගොඩනැගිලක ස්ථානගත කර ඇත. බෙදා වෙන් නොකළ නිෂ්පාදන පොදුකාර්ය පහත පරිදිය.

| | නිෂ්පාදන අංශ (රු.) | ගබඩාව (රු.) |
|---|---|---|
| විදුලිය (බලය සඳහා) | 400,000 | - |
| යන්ත්‍ර ක්ෂය | 350,000 | 50,000 |
| මුරකරු වැටුප් | 300,000 | 70,000 |

ii. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විභජනය හා අදාල තොරතුරු.

| | **මුද්‍රන** | **නිමැවුම්** | **ගබඩා** |
|---|---|---|---|
| කිලෝ වොට් (Kw) | 300 | 100 | - |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 3,000 | 1,000 | 1,000 |
| යන්ත්‍ර පිරිවැය (රු.000) | 500 | 200 | 300 |
| අයවැය ගත යන්ත්‍ර පැය | 3,900 | 500 | 300 |
| අයවැය ගත ඍජු ශ්‍රම | 2,000 | 1,000 | 500 |

iii. නිෂ්පාදන අංශයේ මුරකරු අදාල අංශ දෙක සඳහා සමානව තම සේවාව සපයයි.

iv. ගබඩාවේ ඇති ඉඩ ප්‍රමාණයෙන් $\frac{1}{3}$ ක් අදාල වන්නේ නිමැවුම් අංශය සඳහා වේ.

v. මුද්‍රණ අංශය සඳහා යන්ත්‍ර සූක්ෂම ක්‍රමයටද නිමැවුම් අංශය සඳහා ශ්‍රම සූක්ෂම ක්‍රමයට ද අනුව කටයුතු සිදු කරනු ලැබේ.

vi. එක් පොතක් මුද්‍රණය කිරීම සඳහා නිෂ්පාදන අංශයේ විනාඩි 15 සහ නිමැවුම් අංශයේ විනාඩි 20 ක් ගත වේ.

vii. ආයතනයේ නිපදවන පොත් සඳහා අදාල පිරිවැය තොරතුරු:

| | | |
|---|---|---|
| නිපදවීමට අපේක්ෂිත පොත් | | 1,000 |
| මුද්‍රණ කඩදාසි සඳහා පිරිවැය | රු. | 150,000 |
| පොත් බඳින්නන් සඳහා වැටුප් | රු. | 50,000 |
| ග්‍රන්ථ කතෘ භාගය | රු. | 20,000 |
| මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | රු. | 100,000 |

**අවශ්‍ය වන්නේ:-**

1. ද්විතියික විභජනයද ඇතුළුව පැහැදිලිව දක්වන පරිදි පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රය.
2. නිෂ්පාදන අංශ දෙක සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කරන්න.
3. 'බුදුදහම හා ජීවිතය' පොතක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 20)

03. **(අ)** 2020.03.31 දිනට නාමල් හා පසන් හවුල් ව්‍යාපරයේ ආධුනික ගිණුම් සහායක පිළියෙල කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

| | **රු.000** | **රු.000** |
|---|---|---|
| දේපල (ධාරණ අගයට) | | 2,000 |
| වෙළඳ තොගය | 150 | |
| වෙළඳලැබිය යුතු දේ (ධාරණ අගයට) | 380 | |
| බැංකු ශේෂය | 620 | 1,150 |
| **මුළු වත්කම්** | | **3,150** |
| ප්‍රාග්ධන ගිණුම් - නාමල් | 800 | |
| පසන් | 600 | |
| තුෂාර | 500 | 1,900 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | 1,100 |
| 15% පසන් සැපයූ ණය | 100 | |
| වෙළඳ ගෙවිය යුතු දේ | 50 | 150 |
| | | 3,150 |

**අතිරේක තොරතුරු**

i. නාමල් සහ පසන් හවුල් ව්‍යාපාරයේ කොන්දේසි පහත පරිදි වේ.

- වර්ෂයේ ලාභ හෝ අලාභ 3 : 2 බෙදා ගැනීම
- ප්‍රාග්ධන ගිණුම් වල ආරම්භක ශේෂ මත 10% ක වාර්ෂික පොළියක් හවුල්කරුවන්ට හිමි වේ.
- නාමල් සඳහා වාර්ෂිකව රු. 40,000 වේතන හිමි වේ.

ii. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කළ ශුද්ධ ලාභය හා අනෙකුත් මූල්‍ය ප්‍රකාශන තොරතුරු පහත වැරදි හා මගහැරීම් වලින් සමන්විත වේ.

- පසන්ට ගෙවිය යුතු ණය පොලිය පිළිබඳ කිසිදු සටහනක් ගිණුම් පොත් වල ගලපා නොමැත.
- වෙළඳ ණයගැතියන් විසින් බැංකුවට කෙලින්ම සිදු කරන ලද රු. 100,000 ක ප්‍රේෂණ පිළිබඳ කිසිදු සටහනක් තබා නොමැත. ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වෙළඳ ලැබිය යුතු දේ සඳහා ධාරන අගය ගණනය කර ඇත්තේ, 5% ක හානිකරණ අලාභ ඉඩහැරීම් ගැලපීමෙන් පසුවය.
- 2020.03.31 දිනට ගෙවිය යුතු ප්‍රචාරණ වියදම් රු. 70,000 පිළිබඳව ගිණුම් පොත්වල ගලපා නොමැත.

iii. 2020.03.31 දින හවුල් ව්‍යාපාරයට තුෂාර නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීම සඳහා පහත ගැලපුම් සිදුකළ යුතුය.

- රු. 600,000 ක් මුළු කීර්තිනාමය අගය කර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වලින් ගැලපීම.
- නව හවුල් ව්‍යාපාරය ලාභා'ලාභ සමානව බෙදා ගැනීම.

**අවශ්‍ය වන්නේ:-**

1. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නාමල් හා පසන් හවුල් ව්‍යාපාරයේ ගණනය කළ ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය. ( හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද ඇතුළුව)

2. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්. (අනුතීරු ක්‍රමයට) (ලකුණු 15)

**(ආ)** ඉන්දික විසින් පවත්වා ගෙන යන ව්‍යාපාරයේ පිළියෙල කළ ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ශේෂ ලැයිස්තුවේ ශේෂය පිළිවෙලින් රු. 120,000 ක් හා රු. 32,000 විය.
පසුව විගනකවරුන් පහත වැරදි හඳුනා ගන්නා ලදි.

i. රු. 30,000 ක අත්පිට විකුණුම් ණයගැති ලැබීමක් ලෙස ණයගැති පාලන ගිණුමේ සටහන් වීම.

ii. නිමාට විකුණූ රු. 130,000 ක තොගයක් සාමාගේ ගිණුමේ වැරදි පැත්තේ රු. 13,000ක් ලෙස සටහන් වී ඇත.

iii. විකුණුම් ජ'නලය එකතු කිරීමේදී රු. 10,000 ක් අඩුවෙන් එකතු කර තිබීම.

iv. රු. 50,000 ක විකුණුම් ගිවිසුමක් ඇති කරගත් අතර ඉන් ලද රු. 25,000 ක මුදල ණයගැති ලැබීම් ලෙස පොදු ලෙජරයේ හා උපලෙජරයේ සටහන් වීම.

v. කුමාගෙන් ලද රු. 15,000 ක් පාලන ගිණුමේ රු. 25,000 ක් ලෙසත් උප ලෙජරයේ රු. 10,000 ක් ලෙසත් සටහන් වී තිබීම.

**අවශ්‍ය වන්නේ:-**

1. ණයගැති පාලන ගිණුමේ හා ණයගැති ශේෂ ලැයිස්තුවේ කෙටුම්පත් ශේෂ සැසඳීමේ ප්‍රකාශය
2. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වන ලැබිය යුතු දෑ ශේෂය

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

**04. (අ)** වසන්තගේ ව්‍යාපාරය බාහිරින් අමුද්‍රව්‍ය මිලට ගෙන කර්මාන්ත ශාලව තුල සපත්තු නිපදවා තම ප්‍රදර්ශනාගාරය තුල අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. පහත ගණුදෙනු හා සිදුවීම් 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා අදාල වේ.

(1) 2020.03.01 දිනට ගිණුම් ශේෂයන්,

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය තොගය | රු. | 100,000 |
| නොනිමි තොගය | රු. | 15,000 |
| නිමි වෙළඳ තොගය | රු. | 232,000 |
| වෙළඳ ණයහිමි | රු. | 66,000 |
| වෙළඳ ණයගැති | රු. | - |
| මුදල් ශේෂය | රු. | 119,000 |
| දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ) | රු. | 400,000 |

(2) 2020 මාර්තු මාසය සඳහා අදාළ ගණුදෙනු, සියලුම මුදල් ගණුදෙනු බැංකු ජංගම ගිණුමක් හරහා සිදු වේ.

i. රු. 750,000 සම් තොගයක් මිලට ගත්තා. මින් 20% ක් එදිනම මුදලින් ගෙවූ අතර, ඉතිරිය සති 6 කින් ගෙවීමට එකඟ වූවා.

ii. ශ්‍රමිකයින් සඳහා රු. 250,000 වැටුප් ගෙව්වා. මින් 80% ක් සපත්තු නිපදවන අයවන අතර, 10% ක් දෙනා කම්හල් සුපරීක්ෂකවරුන්ය. ඉතිරිය අලෙවි සේවකයින් වේ.

(3) රු. 600,000 ක පිරිවැය වූ තොග රු. 1000,000 කට අත්පිට විකුණා ඇත.

(4) ආරම්භක දින සිටි වෙළඳ සැපයුම්කරුවන් සඳහා 10% ක මුදල් වට්ටමකට යටත්ව මුදල් ගෙව්වා.

